පරිපාලන නියෝග 08 / 2017

මගේ අංක : පා/1/2/5/2
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2017.09. 26

සියළුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම අධ්‍යක්ෂවරුන්/ ප්‍රධාන ඉංජිනේරු/ ප්‍රධාන ගණකාධිකාරී/
ප්‍රධාන කෘෂි විශේෂඥ / ප්‍රධාන කෘෂි විද්‍යාඥ,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
අතිරේක අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
සහකාර අධ්‍යක්ෂවරුන්,
ස්ථාන භාර නිලධාරීන්,
පරිපාලන නිලධාරීන්,
ඒකක / ශාඛා ප්‍රධානීන්.

**පාලන 04 ශාඛාවේ නාමය "කළමනාකරණ සංවර්ධන, පුහුණු හා ඵලදායිතා ප්‍රවර්ධන ශාඛාව" ලෙස සංශෝධනය කිරීම**

මෙම දෙපාර්තමේන්තුවෙහි පරිපාලන අංශයෙහි පවත්වා ගෙන යනු ලබන "කළමනාකරණ සංවර්ධන හා පුහුණු - (පාලන 04) ශාඛාව" මින් ඉදිරියේදී, "කළමනාකරණ සංවර්ධන, පුහුණු සහ ඵලදායිතා ප්‍රවර්ධන - පාලන 04 - ශාඛාව " ලෙස නම් කරනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

02. "කළමනාකරණ සංවර්ධන, පුහුණු සහ ඵලදායිතා ප්‍රවර්ධන - (පාලන 04) " ශාඛාවෙහි දැනට ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන්ට අමතරව තොරතුරු තාක්ෂණ යෙදවුම්කරණය ද විෂයයක් ලෙස ඇතුලත් කරනු ලබන අතර පරිපාලන අංශය තුළ තොරතුරු තාක්ෂණ විෂයයේ සම්බන්ධීකරණය, පුහුණු කටයුතු සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පාලන අංශයට අදාල යාවත්කාලීන කිරීම් සම්බන්ධ කටයුතු ද පාලන 04 ශාඛාව මගින් සිදු කරනු ලැබේ.

03. කළමනාකරණ සංවර්ධන, පුහුණු සහ ඵලදායිතා ප්‍රවර්ධන - (පාලන 04) ශාඛාවේ වෙබ් අඩවි ලිපිනයන් www.mdtbranch.wordpress.com / www.agriproductivityunit.wordpress.com වන අතර, විද්‍යුත් ලිපිනය (ඊ මේල්) mdt.pa4branch@gmail.com වේ.

04. මේ සම්බන්ධයෙන් ඔබ යටතේ වන සියළුම ආයතන/ මධ්‍යස්ථාන/ ඒකකයන්හි සියළු නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, ඒ අනුව ක්‍රියාත්මක වීමෙන් වඩාත් ඵලදායී සේවාවක් ලබා දීමට සහ ලබා ගැනීමට දායක වන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එච්.පී. දයා මැණිකේ සරත්චන්ද්‍ර.
ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ ශ්‍රේණිය).
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන).
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත් :
ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය. - කාරුණික දැන ගැනීම පිණිස.